(c) www.sinhalalyrics.com

බමුණා වුනත් දුදනෙකු නම් බිම හොවනු
සැඩොලා වුවත් සුදනෙකු නම් පුටුව දෙනු
හෙලයා වුනත් ජඩයෙකු නම් පහර දෙනු
දෙමලා වුනත් විරුවෙකු නම් ගරු කරනු

බුදු හිමි ජේසු හිමි නබි හිමි වැඳ පුදනු
දෑ ගොත් කුල නුදුටු උන් බණ පිළිපදිනු
වැදි බණ මැදින් මුනි බණ තෝරා අසනු
වැදි බණ දෙසන සඟගණ වුව පිටු දකිනු

සිහසුන ඉන්ට රට දැය පාවා නොදෙනු
පාවා දෙන එවුන් මුනට කෙල ගසනු
කසයෙන් තලා හිස පලදා කටු ඔටුනු
ජනයා අභිමුවෙ උන් නිරුවත් කරනු

රජෙකුගේ වුවත් වරදට කෑ මොර ගසනු
මොර දෙන මුවෙහි ලන මිපැණි ඉවත ලනු
නිවැරදි කරනු බැරි රජු නෙරපා හරිනු
වරදට කිපෙනු සටනට වැද ජය ලබනු

පද රචනය - සුනිල් ආරියරත්න
සංගීතය - ගුණදාස කපුගේ